# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1659/2 - 2010 ජුනි 21 වැනි සඳුදා - 2010.06.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 "ආ" වගන්තිය (8) (අ) සහ (8) (ආ) උප වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර, වි. ජ. මු. ලොකුබණ්ඩාර වන මා, මේ ප්‍රකාශනයෙන් වර්ෂ දෙදහස් දහයක් වූ ජුනි මස විසි දෙවැනි දින මධ්‍යම රාත්‍රියෙහි සිට බලපැවැත්වෙන පරිදි සබරගමුව පළාත් සභාවේ වාරාවසාන කරන බවත්, සබරගමුව පළාත් සභාවේ ඊළඟ වාරය පටන් ගැනීමේ දිනය වශයෙන් වර්ෂ දෙදහස් දහයක් වූ ජූලි මස විසි වන දින නියම කරන බවත් මෙයින් දැනගත යුතු ය.

වර්ෂ දෙදහස් දහයක් වූ ජුනි මස දාහතර වැනි දින වූ මෙදින රත්නපුර දී දෙන ලදී.

වි. ජ. මු. ලොකුබණ්ඩාර,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

07-196

---

### සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 "ආ" වගන්තිය (8) (අ) උප වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර, වි. ජ. මු. ලොකුබණ්ඩාර වන මා, මේ ප්‍රකාශනයෙන් වර්ෂ දෙදහස් දහයක් වූ ජූලි මස විසි වන දින පෙ. ව. 10.00 ට රත්නපුර පළාත් සභා සංකීර්ණයේ පළාත් සභා ශාලාවට රැස්වන ලෙස සබරගමුව පළාත් සභාවට නියම කරන බව මෙයින් දැනගත යුතු ය.

වර්ෂ දෙදහස් දහයක් වූ ජුනි මස දාහතර වැනි දින වූ මෙදින රත්නපුර දී දෙන ලදී.

වි. ජ. මු. ලොකුබණ්ඩාර,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

07-197


1A - PG 001152 — 345 (2010/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.